තුරුසවිය අරමුදල - 2019
---------------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
-----------------------------

තුරුසවිය අරමුදල 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය , මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2000 අංක 23 දරන තුරු සවිය අරමුදල් පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

**------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල කටයුතු කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන

---------------

**1.5.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය එකතුව රු. 1,676,060 ක් වූ පරිගණක, කාර්යාල උපකරණ, කාර්යාල ගෘහභාණ්ඩ හා යන්ත්‍රෝපකරණ තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ප්‍රමිති 07 හි 92 ඡේදය ප්‍රකාරව ඵලදායි ජීවිතකාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතුකර නොතිබුණි. | ඉදිරියේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තාවක් ලබාගෙන නිසි පරිදි කටයුතු කරමි. | සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වත්කම්වල ඵලදායි ජීවිතකාලය සලකා බලා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | අරමුදලේ සේවකයින් 05 දෙනෙකු විසින් කම්කරු විනිශ්චය සභාවේ ගොනු කර ඇති කම්කරු ආරවුල සම්බන්ධ නඩුව පිළිබඳව ප්‍රමිති 01 හි 23 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතු වීම . |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් මිල දී ගත් රු. 2,057,587ක ස්ථාවර වත්කම් වටිනාකමට සමාන මුදලක්, තුරුසවිය අරමුදලට ගැලපීම් නොකර ආදායමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගලපා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන ප්‍රදානවලින් වලින් මිල දී ගත් වත්කම්වලට සමාන හිමිකමක් ඇති කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු මත පොළිය රු.748,538 ක් වුවද, එය රු.1,025,576 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා පොළී ආදායම රු. 277,038 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාළ පොලිය පමණක් ආදායමට ගත යුතු වීම. |
| (ඇ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගලපා තිබූ සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂිකය මූල්‍ය නොවන ගැලපීම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපිය යුතු වුවත්, එම අගයෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවූ පාරිතෝෂිකය අඩුකල පසු ඉතිරිය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ දක්වා තිබුණි. තවද වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය මූල්‍ය නොවන ගැලපීම් යටතේ ගැලපිය යුතු වුවත් එය ද කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ ගලපා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීම කළ යුතු වීම. |

**1.5.3 ලැබිය යුතු ගිණුම්**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 5 ත් වර්ෂ 17 ත් අතර කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින ලැබිය යුතු එකතුව රු.826,110 ක ණය ශේෂය අයකරගත නොහැකි වී තිබුණි. | තුරුසවිය අරමුදල ආයතනය මගින් බිම් තරාදි මිලදී ගැනීම සඳහා සමිති වෙත ලබාදුන් ණය මුදල් නැවත අයකර ගැනීම සඳහා ණය අයකර ගැනිමට ඇති සමිති වෙත නිතිමය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් එන්තරවාසි මගින් දැනුවත් කිරීම් සිදු කොට ඇති අතර, නොඑසේ නම් අදාල තරාදි නැවත තුරුසවිය අරමුදල වෙත ගෙන ඒමට කටයුතු කරමි. | ණය අයකර ගැනීම සඳහා පියවර ගැනිය යුතු වීම. |
| (ආ) | රබර් ෂීට් මිල දී ගැනීම සඳහා තුරුසවිය සමිති 02 කට මාස 06 කින් නැවත අයකර ගැනීමේ පදනම මත 2019 වසර තුළ දී ලබා දී තිබූ රු.1,000,000 ක ණය මුදලෙන් සමාලෝචිත වසර අවසාන වන විටත් කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණි. | ඇගල්ඔය තුරුසවිය සමිතිය හා කරවිට ජනපදය තුරුසවිය සමිතිය වෙත මේ සම්බන්ධයෙන් අවසාන නිවේදන ලිපි මගින්ද, දුරකථනයෙන්ද දැනුවත් කිරීම් සිදු කර ඇති අතර, ඉදිරි සතිය ඇතුලත අදාල ණය මුදල් පියවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | පිළිගත හැකි ඇපයක් ලබාගෙන ණය මුදල් ලබාදීමට කටයුතු කළ යුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | දෛනික ධාවන සටහන් සහ 268(අ) වැනි පොදු ආකෘති පත්‍රයේ ලියන ලද මාසික සාරාංශයේ මුල් සටහන සෑම මසක් අවසන් වී ඊළග මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පවත්නා නීති රෙගුලාසිවලට අනුකූල විය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනතේ 32(3) වගන්තිය | අරමුදල පිහිටුවා වසර 20 කට වැඩි කාලයක් ගත වුවද 14(2)(ච) වගන්තිය ප්‍රකාරව පිළියෙල කර තිබූ නියෝග ගැසට් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | එවකට සිටි කළමනාකාරිත්වය විසින් රීති ගැසට් කිරීමට අදාල ලිපි ලේඛන අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත යවා ඇති බව සදහන් කළද, එය කිනම් ස්ථානයක නතර වී ඇත්දැයි මේ වනවිට සොයමින් පවතී. | පනත අනුව නියෝග ගැසට් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වීම. |
| (ඇ) | 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | රාජ්‍ය බැංකුවල කළ ආයෝජන කල් පිරුන විට නැවත ආයෝජනය කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව හා භාණ්ඩාගාරය විසින් මැදිකාලීන ආයෝජන සඳහා ගෙවනු ලබන පොලී අනුපාතයට යටත්ව වසර දෙකකට හෝ ඊට වැඩි කාලපරිච්ඡේදයක් සඳහා වන බැංකු තැන්පතු හෝ භාණ්ඩාගාර බැඳුම්කරවල වුවද, අරමුදලේ රු. 8,512,831 ක ආයෝජන ආරම්භයේ සිටම මාස 06 ක කෙටිකාලීනව ආයෝජන යටතේ ආයෝජනය කර තිබුණි. | අප ආයතනයේ මෙම ස්ථාවර තැන්පතුව පවත්වාගෙන යනු ලබන්නේ සේවකයින්ගේ පාරිතෝෂිත දීමනා ගෙවීමට සිදු වන දිනක දී ඒ සඳහා අවශ්‍ය අරමුදල් ලෙසය. බොහෝ විට භාණ්ඩාගාර බැදුම්කර වල පොළී අනුපාතයට වඩා ස්ථාවර තැන්පතු වල පොළී අනුපාතය ඉහළ අගයක් ගනී. එම හේතුවෙන් සිදු වන අලාභය අවම වනසේ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත. | කෙටිකාලීන බැංකු තැන්පතුවල ආයෝජනය නොකර භාණ්ඩාගාරය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට අනුව වසර දෙකකට හෝ ඊට වැඩි කාලපරිච්ඡේදයක් සඳහා වන බැංකු තැන්පතුවල මුදල් ඵලදායී ලෙස ආයෝජනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,469,974 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 234,947 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,235,027ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් මිලදි ගත් රු. 2,057,587 ක ස්ථාවර වත්කම්වලට සමාන ප්‍රමාණයක් ආදායමක් ලෙස සලකා තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** ප්‍රධාන ආදායම් ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන ලෙස ලද රු. 46,561,250 ක් හා වෙනත් ව්‍යාපෘති සඳහා ප්‍රදාන රු. 14,419,669 ක් වුවද ඉකුත් වර්ෂයේ ලද ප්‍රාග්ධන ප්‍රදාන හා වෙනත් ව්‍යාපෘති සඳහා ප්‍රදාන රු. 31,762,045 ක් සමග සැසඳීමේ දී රු.29,218,876 ක වැඩිවීමක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 92 ක් විය.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා රබර් වතු හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික්ක 14 ක ලියාපදිංචි කර තිබූ තුරුසවිය සමිති 712 ක ශ්‍රේණිගත කිරීමේ කටයුතු සමාලෝචිත වසර අවසාන වන විටත් අවසන් කර නොතිබුණි. | මේ පිළිබඳව තුරුසවිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් අවස්ථා කිහිපයකදී දැනුවත් කර ඇති අතර, කඩිනමින් අදාළ ක්‍රියාවලිය අවසන් කරන බව දන්වා සිටිමි. | සමිති ශ්‍රේණිගත කිරීමේ කටයුතු කඩිනමින් සිදු කර,සමිති පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2011 වර්ෂයේ සිට 2016 වසර දක්වා මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ස්ථාපනය කරනු ලැබූ ග්‍රාමීය රබර් සංසද 130 ක් හා සමූහ සැකසුම් මධ්‍යස්ථාන 31 ක් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පවරා ගැනීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් අනුමැතිය දී තිබුණද ඉන් සංසද 77 ක් හා සැකසුම් මධ්‍යස්ථාන 06 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තුරුසවිය අරමුදල පනත ප්‍රකාරව මෙම ග්‍රාමීය රබර් සංසද සියල්ලම එකවර තුරුසවිය අරමුදල වෙත පවරා ගැනීමේ හැකියාවක් නොමැත. ඒ සඳහා පළමුව එකී සංසද සියල්ල ක්‍රමානුකූලව තුරුසවිය සමිති ලෙස ලියාපදිංචි කර ගත යුතුය. ඒ අනුව මේ වන විට ග්‍රාමීය රබර් සංසද 130 න් 53ක්ද, සමූහ රබර් සැකසුම් හල් පවතින ග්‍රාමීය රබර් සංසද 31 න් 25 ක් මේ වන විට තුරුසවිය අරමුදල යටතේ ලියාපදිංචි කර ඇත. | 2017 මාර්තු 01 සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 03 ට වඩා ගත වී ඇති බැවින් පවරා ගැනීමේ කටයුතු තවදුරටත් ප්‍රමාද නොකළ යුතු වීම |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රබර් ෂීට් සමූහ සැකසුම් මධ්‍යස්ථාන 03 ක් සඳහා රු.3,492,301 ක් වියදම්කර ඇතත්, එයින් මධ්‍යස්ථාන 02 ක් සාදා නිමකර නොතිබුණු අතර, ඉතිරි ගොඩනැගිල්ල භාවිතා නොකර තිබුණි. | කළුතර දිස්ත්‍රික්කයේ හැඩිගල්ල ජනපදය ඉදිකර තිබූ සමූහ සැකසුම් මධ්‍යස්ථානයේ නිෂ්පාදන කටයුතු ඇන සිට ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ ගනේපල්ල සමූහ සැකසුම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළද, පරිසර දූෂණය සම්බන්ධ ගැටළුවක් මුල් කරගෙන විරෝධතාවයක් එල කිරීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමග නතර කිරීමට සිදු විය. රත්නපුර දිස්ත්‍රික්කයේ ඇරැපොල එක්සත් සමූහ සැකසුම් මධ්‍යස්ථානයේ ද ඉදිකිරීම් කටයුතු අතරමග නවතා ඇත. | වත්කම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත යුතු වීම. |